# රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
## அரச கணக்குகள் திணைக்களம்
## Department of State Accounts


මගේ අංකය / எனது இல. / My No. SAD/S&T/GPS/12 | ඔබේ අංකය / உமது இல. / Your No. | Date 2012.05.31

රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ : 223/2012

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පලාත්සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්, සහ
දිස්ත්‍රික් ලේකම් වරුන් වෙත.

මහත්මයාණෙනි / මහත්මියනි

**<u>ජූලි 31 දිනට රජයේ වැටුප් පිළියෙල කිරීමේ පරිගණක වැඩසටහනට (GPS) ඇතුලත්කර ඇති නිලධාරීන්ගේ තොරතුරු එක්රැස් කිරීම.</u>**

මධ්‍යම රජයේ හා පලාත්සභාවන්හි සේවය කරනු ලබන සියලු සේවා නියුක්තිකයින්ගේ සංඛ්‍යාව එක් එක් සේවා අනුව හා දරනු ලබන තනතුරු අනුව එක්රැස් කර එක් පරිගණකගත ගොනුවක් සකස් කිරීමට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව කටයුතු යොදා ඇත. රජයේ ගිණුම්කරණයේ වාර්තාමය තත්ත්වය වැඩිදියුණු කිරීම් හා යම් යම් තීරණ ගැනීම සඳහා මෙම දත්ත උපයෝගි කර ගැනීමට මෙමගින් බලාපොරොත්තු වේ.

02. මධ්‍යම රජයේ හා පලාත්සභාවන්හි සේවය කරනු ලබන සේවා නියුක්තිකයින්ගේ වැටුප් පිළියෙල කිරීම දැනටමත් මෙම අමාත්‍යාංශය විසින් 1996 වර්ෂයේ සිට හඳුන්වාදෙනු ලැබූ GPS (Government Payroll System) පරිගණක වැඩසටහන භාවිතා කිරීමෙන් සිදු කරනු ලබයි. එම වැඩසටහන යටතේ දැනට ඇතුලත් කර ඇති දත්ත එක් පරිගණක වැඩසටහනක් භාවිතා කර ස්වයංක්‍රීයව ගොනුවකට ඒකාබද්ධ කිරීම මගින් ඉහත තොරතුරු ලබා ගැනීමට සැලසුම් කර ඇත.

03. ඒ සඳහා සෑම වර්ෂයකම ජූලි මාසයේ වැටුප් පිළියෙල කල පසු ඔබ ආයතනයේ සහ ඒ යටතේ ඇති සියලුම උප කාර්යාලයන්හි භාවිතා කරනු ලබන GPS පරිගණක වැඩසටහනේ ඇතුලත් සේවා නියුක්තිකයින්ගේ තොරතුරු අඩංගු Employee Master File ( Pyrempma.dbf) ගොනුවෙහි ඒ ඒ සේවා නියුක්තිකයාගේ අදාල සේවාව, තනතුර. ජාතික හැඳුනුම්පත් අංකය, උපන් දිනය සහ 04වන ඡේදයේ සඳහන් ආකාරයට අකාරාදී පිළිවෙලට ලැයිස්තු ගත කර ඇති සේවා සංකේත ද ඊට අමතරව දෙපාර්තමේන්තු ගත තනතුරු පවතී නම් එම සේවා තොරතුරු ද උපයෝගී කර ගෙන නව සේවා සංකේතයක් නිර්මාණය කර, අදාල ස්ථානයන්හි නිවැරදි ලෙස ඇතුලත් කරන්න. ඉන්පසුව එක් එක් කාර්යාලයේ හා එක් එක් වැටුප් කට්ටලවල Employee Master File එක පමණක් වෙන වෙනම ෆෝල්ඩර්වලට පිටපත් කර පසුව එම ෆෝල්ඩර් සියල්ලම CD එකකට හෝ DVD එකකට පිටපත් කර අප වෙත ලැබීමට සලස්වන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

04. GPS වැඩසටහනේ තනතුරු නාම ඇතුලත් Pyrservc.dbf හා service.xls නමැති ගොනු රාජ්‍ය පරිපාලන 6/2006 චක්‍රලේඛයේ සඳහන් සේවා හා තනතුරු ඇතුලත් කර සකස් කර ඇති අතර එම ගොනු අපගේ වෙබ් පිටුව වන www.treasury.gov.lk හි රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව තෝරා CIGAS/GPS යටතේ ලබාගෙන සේවා තොරතුරු service.xls භාවිතා කර මුද්‍රණය කරගත හැකි අතර Pyrservc.dbf ගොනුව ඔබ ආයතනයේ GPS ෆෝල්ඩරයට කොපිකර ගැනීමෙන් එම සේවා තොරතුරු GPS වැඩසටහනේ නිලධාරීන්ගේ දත්ත වෙනස් කිරීමේදී භාවිතා කළ හැකි වේ.


මහ භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව  பொது திறைசேரி, கொழும்பு 01, இலங்கை.  General Treasury, Colombo 01, Sri Lanka.  General - Tel.: +94 112 484600  Website: www.sad.gov.lk
Director General - Tel.: +94 112 484728  Fax: +94 112 473856  e-mail: dgsa@sad.treasury.gov.lk  Additional Director General - Tel.: +94 112 484898
Director (Accounting & Reporting): +94 112 484747  Director (Accounting Services): +94 112 484753  Director (Systems & Training): +94 112 484733

05. ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ශ්‍රී ලංකා යුධ හමුදාව, හා ශ්‍රී ලංකා නාවික හමුදාවේ සිවිල් නිලධාරීන්ගේ තොරතුරු පමණක් ඉහත අංක 03 උපදෙස් අනුව එවීමට කටයුතු කරන මෙන් ඉල්ලමි.

06. ඉහත තොරතුරු නිවැරදිව නියමිත දිනට ඉදිරිපත් කර දැනටමත් භාවිතා කරනු ලබන GPS පරිගණක පද්ධතිය තවදුරටත් ඵලදායි කිරීමට දායක වන මෙන් කාරුණිකව ඉල්ලමි.

07. මේ සම්බන්ධව යම් විමසීමක් කිරීමට අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක **011-2484730** හෝ **011-2484826** යටතේ සහකාර අධ්‍යක්ෂ **ඩබ්ලිව්.ඒ.කේ.එස්.ද අල්විස් මහතා** හෝ සහකාර අධ්‍යක්ෂ **එස් දර්ශන් මහතා** ඇමතීමට කටයුතු කරන්න.

මෙයට - විශ්වාසී,

එන්.ජී.දයාරත්න,
රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්.